# ජාතික පාසල් සඳහා විදුහල්පතිවරුන් තෝරා පත් කර ගැනීම - 2024
# (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණිය)

## ලකුණු පරිපාටිය

**1. ජ්‍යෙෂ්ඨතාවය** *උපරිම ලකුණු 30*

(ශ්‍රී ලං.වි.සේ 1 ශ්‍රේණියට උසස් වූ දින සිට වසරකට ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව 1 ශ්‍රේණියේ වැඩිම සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස 1 ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ද ලකුණු හිමි වන පරිදි ලකුණු ලබාදීම සිදු කරනු ලැබේ. තවද විනය දඬුවමක් මත හෝ වැටුප් රහිත නිවාඩු ලබාගැනීම මත හෝ සතුටුදායක සේවා කාලය අහිමි වූ නිලධාරියෙකුට පමණක් එම කාලය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

**2. පාසල් කළමනාකරණය පිළිබඳ සේවා පළපුරුද්ද** *උපරිම ලකුණු 20*

**2.1. විදුහල්පතිවරයෙකු වශයෙන්**

පත්වීම් ලිපිය සේවා ව්‍යවස්ථානුකූල විධිවිධාන පරිදි පත්වීම් බලධාරියා විසින් හෝ බලය අභිනියෝජිත බලධාරියා විසින් හෝ (අමාත්‍යාංශ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම්/පළාත් අධ්‍යාපන ලේකම්) නිකුත් කර තිබිය යුතුවේ.

| | |
|---|---|
| a. 1AB පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් පූර්ණ එක් වසරකට | 03 |
| b. 1C පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් පූර්ණ එක් වසරකට | 02 |
| c. 2 වර්ගයේ පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් පූර්ණ එක් වසරකට | 01 |
| d. 3 වර්ගයේ පාසලක විදුහල්පතිවරයෙකු වශයෙන් පූර්ණ එක් වසරකට | 01 |

**2.2. නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙකු වශයෙන්**

| | |
|---|---|
| a. 1AB පාසලක නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙකු වශයෙන් පූර්ණ එක් වසරකට | 02 |
| b. 1C පාසලක නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙකු වශයෙන් පූර්ණ එක් වසරකට | 01 |
| c. 2 හෝ 3 වර්ගයේ පාසලක නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයෙකු වශයෙන් පූර්ණ එක් වසරකට | 01 |

**සටහන 01 :** මාස 12ක සේවා කාලයක් සඳහා පමණක් වසරකට හිමි මුළු ලකුණු සංඛ්‍යාව හිමිවන අතර, ඊට වඩා අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ. තවද රාජ්‍ය සේවා කොමිෂන් සභා අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 141 ප්‍රකාරව පත්කර ඇති නිලධාරීන්ට ද ලකුණු ලබාදෙනු නොලැබේ.

**සටහන 02 :** ඉහත 2.1, 2.2 ට අදාලව අදාල පාසල පත්වීම් / ස්ථාන මාරු ලිපිය නිකුත් කරන අවස්ථාවේදී පාසල් වර්ගීකරණය අනුව 1AB, 1C ,2,3 පාසලක් ලෙස පැවති බව හා එම ලිපි අත්සන් කර ඇත්තේ නියමිත පත්වීම් / බලය අභිනියෝජිත බලධාරියා විසින් බවට ලිඛිතව සනාථ කළ යුතුය.

**3. අතිරේක අධ්‍යාපන සුදුසුකම්** *උපරිම ලකුණු 15*

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ**

(බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා හෝ උසස්වීම් සඳහා හෝ මූලික සුදුසුකමක් ලෙස අදාල කරගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.)

| | |
|---|---|
| 3.1. පශ්චාත් උපාධිය හෝ ඊට ඉහළ සුදුසුකමක් | - ලකුණු 15 |
| 3.2. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 12 |
| 3.3. මූලික උපාධිය | - ලකුණු 09 |
| 3.4. පාසල් කළමනාකරණ ඩිප්ලෝමාව | - ලකුණු 06 |
| 3.5. වෙනත් ඩිප්ලෝමා | - ලකුණු 03 |

(උක්ත 3.4 හා 3.5 යටතේ ලකුණු ලබාදීමේදී අදාළ ඩිප්ලෝමාවේ අධ්‍යයන කාලසීමාව අවම වශයෙන් පැය 450ක් හෝ මාස 9 කට හෝ වැඩි විය යුතු අතර අදාල ඩිප්ලෝමාව ප්‍රදානය කරන ආයතනය රජයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් විය යුතුය. )

**4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** *උපරිම ලකුණු 05*

**( සන්නිවේදන කුසලතාවය සලකා බලනු ලැබේ)**

**5. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** *උපරිම ලකුණු 05*

**( ප්‍රායෝගික භාවිතය පිළිබඳව සලකා බලනු ලැබේ)**

**6. සේවා ඇගයීම්** *උපරිම ලකුණු 03*

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 1 බැගින් උපරිම සේවා ඇගයීම් 3 ක් සඳහා

සටහන:

(දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු, පළාත් ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වේ.)

**7. ඉදිරිපත් කිරීම** *උපරිම ලකුණු 12*

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා, වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති හා 21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අභියෝග පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික පාසල් විදුහල්පතිවරයෙකු ලෙස ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන ආකාරය පිළිබඳව, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරු කරගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර, එම ඉදිරිපත් කිරීමට අදාළ දෘශ්‍ය පිටපතක් ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

| | |
|---|---|
| 7.1 ප්‍රවේශය හා හැඳින්වීම | - ලකුණු 02 |
| 7.2 අන්තර්ගතය- (පාසල හඳුනාගැනීම, අරමුණු, යෝජනා) | - ලකුණු 05 |
| 7.3 ඉදිරිපත් කිරීමේ කුසලතා | - ලකුණු 03 |
| 7.4 කාල කළමනාකරණය | - ලකුණු 02 |

**8. සිද්ධි අධ්‍යයනය** *උපරිම ලකුණු 05*

(සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාචික සිද්ධියක් ඇසුරින් ප්‍රශ්ණ යොමු කරනු ලබන අතර සිද්ධිය විශ්ලේශණය හා ගැටළුවට ලබාදෙන විසඳුම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.)

**9. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ථ කුසලතාවය හා පෞරුෂත්වය** *උපරිම ලකුණු 05*

*මුළු ලකුණු* ***100***